සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	නාට්‍ය හා රංග කලාව I	කාලය / நேரம் / Time	පැය 01යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- 01 සිට 40 තෙක් දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

- පහත දැක්වෙන කවි, සිංදු, ගීත ඇසුරින් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A.
ඉණට පියුම් ලා පැදුරත් වියම්මා
බඳට පියුම් ලා පැදුරත් වියම්මා
පයට පියුම්ලා පැදුරත් වියම්මා
සැමියට තලන්නට පැදුරත් වියම්මා

B.
සම්මාදමේ අපි යනවා බොලන්නේ
සම්මාදමට මොකවත් ලැබුන අනේ
පමා නැතිව සම්මාදම් දෙනුය අනේ
සෝලිය ගුරුට දයාව මොකවත් ලැබෙනු අනේ

C.
මොරොට්ටු ගම්මන සුරුට්ටු උරමින
කොරොට්ටු වැඩ දන් පුරා බාස් මං
වඩුවැඩ ලංකාවේ හොඳ තරමට දන්නා
වඩු වැඩ ලංකාවේ

D.
රිදී රත්තරං ඇඳගෙන - හැට්ට රෙද්ද උජාරුවට
අස්සය පිට නැඟ යනකොට - දකින දකින අය කියාවී
ආන් යනව
කළු අප්පුගෙ දූයි කියලා - කලු හාමිගෙ දූයි කියලා

E.
රජුන් අග විලසට - මුදලිඳු බසින් සහතුට
ආරච්චි මෙ සබෙට - ඒය විසිතුරු බලනු කදිමට

1. ලංකාවේ උඩරට පළාතේ බිහි වූ මුල්ම ගැමි නාටකයට අදාළ පද්‍ය පදය වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (d) E ය.

2. පහතරට ප්‍රදේශවල වෙස්මුහුණු පැළඳ සිදුකරනු ලබන්නා වූ ජන නාටකයට අයත් වනුයේ,
(1) A ය. (2) B ය. (3) D ය. (d) E ය.

Past Papers Wiki

3. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද නාටකයට අයත් වනුයේ,
   (1) B ය. (2) C ය. (3) D ය. (d) E ය.

4. තාල වාදනය සඳහා මද්දලය යොදා ගන්නා රංග සම්ප්‍රදායට අයත් ගායනයක් වනුයේ,
   (1) A ය. (2) B ය. (3) C ය. (d) D ය.

5. සශ්‍රීකත්වය හා සෞභාග්‍ය අරමුණු කර ගනිමින් උඩරට පළාතේ රඟ දක්වන ශාන්ති කර්මයකට අයත් වනුයේ,
   (1) A ය. (2) B ය. (3) C ය. (d) E ය.

- නිවැරදි පිළිතුර තෝරන්න.

6. ප්‍රාසාංගික කලාව යනු,
   (1) ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කරන සජීවී කලාවක් ය.
   (2) තරු සංකල්පය මත රූපවාහිනියේ ඉදිරිපත් කරන සංගීත හා නර්තන වැඩසටහන් ය.
   (3) ප්‍රක්ෂේපණ යන්ත්‍ර මගින් තිරයකට යොමු කරන චිත්‍රපට වැනි කලාවක් ය.
   (4) චිත්‍ර, මූර්ති, සැරසිලි සහිත දෘශ්‍ය කලාවක් ය.

7. නාට්‍යය යනු,
   (1) භාව ප්‍රකාශනයෙන් තොර වූ හුදු නර්තනයයි.
   (2) සතරවිධ අභිනයෙන් සමන්විත වූවකි.
   (3) භාව ප්‍රකාශනයෙන් සමන්විත නර්තනයකි.
   (4) ආංගික අභිනයට ප්‍රමුඛස්ථානයක් ලබා දී සාත්වික අභිනය මුසු වූ නර්තනයයි.

8. රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ අතර වඩාත් ප්‍රමුඛ වනුයේ,
   (1) වේදිකා අවකාශය ප්‍රධාන තිරයකින් හා පැති තිරවලින් ආවරණය කර තිබිය යුතුය.
   (2) නළු නිලියන්ට විවේක ගැනීමට කාමරයක් තිබිය යුතු ය.
   (3) ආලෝකය සවි කිරීමට අවශ්‍ය විදුලි පහන් සෑම දෙසින් ම සවිකර තිබිය යුතුය.
   (4) ප්‍රේක්ෂකයාට පහසුවෙන් නැරඹීමට හැකි පරිදි පිහිටා තිබිය යුතුය.

9. නාට්‍යයක පෙළ රචනා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වනුයේ,
   (1) කතාවේ මුල, මැද, අග සිද්ධි අනිවාර්යෙන් අනුපිළිවෙළින් විය යුතු ය.
   (2) චරිතවල ගති ලක්ෂණ වෙනස් නොවන අයුරින් නිරූපණය කළ යුතු ය.
   (3) චරිතවල අරමුණු හෙලිවන ආකාරයට දෙබස් රචනා විය යුතු ය.
   (4) වේදිකාවේ පරිසරය නිරූපණය කිරීම සඳහා ගීත භාවිත කළ යුතු ය.

10. වේදිකාවේ එක් චරිතයක් හෝ වස්තුවක් හෝ ස්ථානයක් පමණක් ප්‍රේක්ෂකයාගේ වැඩි අවධානයට යොමු කිරීම සඳහා යොදා ගනු ලබන්නා වූ ආලෝක පහන වනුයේ,
   (1) ධාරාලෝක පහන (2) තිත් පහන (3) අල්ට්‍රා වයලට් පහන (4) ස්ට්‍රොබ් පහන

11. වේදිකාවක භූගෝලීය බෙදීම පිළිබඳ අවබෝධය වඩාත් වැදගත් පිරිස වනුයේ,
(1) පෙළ රචක / රංගන ශිල්පීන් / අංග රචනා ශිල්පීන්
(2) නිෂ්පාදක / ප්‍රේක්ෂකයා / රංගන ශිල්පීන්
(3) පසුතල ශිල්පීන් / අධ්‍යක්ෂක / ප්‍රේක්ෂකයා
(4) අධ්‍යක්ෂක / ආලෝක ශිල්පීන් / රංගන ශිල්පීන්

12. රංග වින්‍යාසය නිර්මාණය කිරීමේදී නර්තනය භාවිත කර ඇති අවස්ථාවක් වනුයේ,
(1) නරිබෑණා නාට්‍යයේ නරියා ගම ගෙදරට පැමිණෙන අවස්ථාව
(2) හුණුවටයේ කතාව නාටකයේ නටාලියා මාලිගයෙන් පලා යන අවස්ථාව
(3) මනමේ නාටකයේ වැද්දන් වේදිකාවට පැමිණෙන අවස්ථාව
(4) විකෘති නාටකයේ ප්‍රියංගනී බැලීමට මනාලයා පැමිණි අවස්ථාව

13. නාට්‍යයකට සංගීතය භාවිත කිරීමේදී බොහෝ විට යොදා නොගන්නා හෝ අවම වශයෙන් භාවිත කරනුයේ,
(1) ලෝකධර්මී නාට්‍යවල ය.
(2) නාට්‍යධර්මී නාට්‍යවල ය.
(3) ළමා නාට්‍යවල ය.
(4) මුද්‍රා නාට්‍යවල ය.

14. නාට්‍යයක වේදිකා පසුතල සම්බන්ධව වඩාත් ගැළපෙන පිළිතුර වනුයේ,
(1) නාට්‍යයේ ජවනිකාවෙන් ජවනිකාවට වෙනස් කළ යුතු ය.
(2) නාට්‍යමය ක්‍රියාවලිය සමඟ බද්ධව තිබිය යුතු ය.
(3) ශිල්පියාගේ දක්ෂතාව මැනවින් ඉස්මතු විය යුතු ය.
(4) අඩුම මිල අමුද්‍රව්‍ය යොදාගෙන නිර්මාණය කළ යුතු ය.

15. අංග රචනයේ දී විවිධ හැඩතල මතුකිරීමට හා රේඛා ඇඳීම සඳහා යොදා ගනු ලබන්නේ,
(1) පෑන් කේක්
(2) ග්‍රිස් පෙන්ට්
(3) මේකප් පෙන්සිල්
(4) පවුඩර්

16. නාට්‍යෝපකරණ සම්බන්ධව වඩාත් නිවැරදි වනුයේ,
(1) ළමා නළුවන්ට භාවිත කිරීමට අපහසු නිසා ළමා නාට්‍යවල දී අවම වශයෙන් භාවිත කරයි.
(2) ලෝකධර්මී නාට්‍ය සඳහා පමණක් භාවිත කරයි.
(3) වේදිකා සහායකවරුන්ට ඔසවාගෙන යාමට පහසු පරිදි සැහැල්ලු ලෙස නිර්මාණය කළ යුතු ය.
(4) අධ්‍යක්ෂවරයාගේ උපදෙස් පරිදි නාට්‍යයේ ශෛලියට ගැළපෙන ලෙස සකස් කළ යුතු ය.

17. නාට්‍යයකට වේෂභූෂණ නිර්මාණය කිරීමේදී සැලකිය යුතු කරුණු වනුයේ,
(1) ශෛලිය / නළුවාගේ රුචිකත්වය / ගුණාත්මක බව
(2) කාලය / ශෛලිය / යුගය
(3) දේශීය අමුද්‍රව්‍ය භාවිතය / අමුද්‍රව්‍ය පිරිමැස්ම / ශෛලිය
(4) දීප්තිමත් බව / ශෛලිය / අඩු මිල අමු ද්‍රව්‍ය

18. බුදුන් වහන්සේ හා ගද්‍රභයා අතර සිදුවන අවස්ථාවක් නිරූපණය වන බෞද්ධාගමික වත්පිළිවෙත වනුයේ,
(1) යුගාසන කතා
(2) දොරකඩ අස්න
(3) ආලවක දමනය
(4) මිලින්ද ප්‍රශ්නය

19. "නාට්‍ය යනු ක්‍රියා අනුකරණයකි." යනුවෙන් පැවසුයේ,
(1) ඇරිස්ටෝටල්
(2) ධනංජය
(3) භරත මුණි
(4) බර්නාඩ් ෂෝ

- පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක 20 සිට 24 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නාට්‍යයේ නම	රචකයාගේ නම	පරිවර්තනය / අනුවර්තනය	මෙරට නිෂ්පාදක / අනුවර්තක
A	ටෙනිසි විලියම්ස්	අහස් මාලිගා	හෙන්රි ජයසේන
ත්‍රිපෙනි ඔපෙරා	B	පැන්ස තුනේ කතාව	විජිත ගුණරත්න
රූඩන්ස්	ප්ලෝටස්	C	බන්ධුල ජයවර්ධන
ද ඩ්‍රැගන්	යෙව්ගිනි ෂ්වාට්ත්ස්	මකර රාක්ෂයා	D

20. ඉහත වගුවේ A ට අදාළ වනුයේ,
(1) අවර් ටවුන් (2) ද ග්ලාස් මෙනාජරි (3) දි එල්ඩර් සන් (4) වරන්දාස්


21. ඉහත වගුවේ B ට අදාළ වනුයේ,
(1) ටෙනෙසි විලියම්ස් (2) ඔගස්ට් ස්ට්‍රින්බර්ග් (3) බර්ටෝල් බ්‍රෙෂ්ට් (4) බර්නාඩ් ෂෝ ය.

22. ඉහත වගුවේ C ට අදාළ වනුයේ,
(1) දේවතා එළි (2) ලියතඹරා (3) උත්තමාවි (4) කඹය

23. ඉහත වගුවේ D ට අදාළ වනුයේ,
(1) ධම්ම ජාගොඩ (2) බන්දුල විතානගේ (3) රංජිත් ධර්මකීර්ති (4) ධර්මසිරි බණ්ඩාරනායක

24. පූනා මඩු ශාන්තිකර්මයට අදාල වනුයේ,
(1) මැටියෙන් තනන ලද භාජනය ගවයෙකුගේ හිසේ ගසා බිඳ දැමීම.
(2) ඇතෙකු අල්ලා මංගර දෙවියන්ට පූජා කිරීම.
(3) දෙවොල් දෙවිවරු ගිනි කඳු මත නැඟ පෙළහැර පෑම.
(4) කුළු මීමෙකු අල්ලා මංගර දෙවියන්ට පූජා කිරීම.

- 25 සිට 29 තෙක් ප්‍රශ්න සඳහා පහත ඡායාරූප ඇසුරු කර ගනිමින් පිළිතුරු සපයන්න.


A


B


C


D


E

25. ග්‍රැමෆෝන් යුගයේ සිට ගායන ක්ෂේත්‍රයෙන් ද, මිනර්වා නාට්‍යවල රංගනයෙන් සහ පසුව චිත්‍රපට රංගනයෙන් ද ජනප්‍රිය වූයේ,
1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

26. දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ පෝෂණයට ඉමහත් දායකත්වයක් දැක්වූයේ,
1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

27. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාටකයේ ප්‍රථම නිෂ්පාදකයාට සම්බන්ධ වූයේ,
1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

28. දුන්න දුනු ගමුවේ, තට්ටු පොලේ ආදී ලෝකධර්මී සම්ප්‍රදායේ ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

29. ගර්ෂියා ලෝර්කාගේ යෙර්මා නාට්‍යයේ අනුවර්තනයක් ලෙස බිහි වූ මූදු පුත්තු නාට්‍යයට සම්බන්ධ වූයේ,
1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

30. විශ්ව විද්‍යාල නාට්‍ය යුගයේ 1933 – 1942 මුල් අදියරේ ඊ. එෆ්. සී. ලුඩෝවයික් විසින් නිෂ්පාදනය කරන ලද ඉංග්‍රීසි නාට්‍යයක් වනුයේ,

(1) The Marriage (2) The Cherry Orchard (3) Where women Rule (4) Mother Courage

31. ආදි විශ්ව විද්‍යාලයීය ඉංග්‍රීසි නාට්‍යවලට රංගනයෙන් දායක වූ ශිල්පිනිය,

(1) ග්‍රේටා ජෙනට් ද සිල්වා ය. (2) ජෙමිනි කාන්තා ය. (3) අයිරාංගනී සේරසිංහ ය. (4) රුක්මණි දේවි ය.

32. වසර ගණනාවක් පුරාවට මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාටකයේ සිංහයාගේ චරිතය නිරූපණය කළ ශිල්පියා,

(1) මාක් ඇන්ටනී ප්‍රනාන්දු ය. (2) හෙන්රි ජයසේන ය. (3) නීල් අලස් ය. (4) සොලමන් ෆොන්සේකා ය.

33. පහත පිළිතුරු අතරින් සොකරි ගැමි නාටකයට අදාල වනුයේ,

(1) වෙස් අත්ත/ මෝල් ගහ/ වංගෙඩිය (2) දුන්න / කුල්ල/ වෙස් මුහුණ
(3) වංගෙඩිය / වෙස්මුහුණ / මෝල්ගහ (4) කඩුව / මෝල්ගහ / පන්දම

34. දේශීය කෝලම් ජන රංගය පිළිබඳව කරන ලද පර්යේෂණයන්ට අනුව නිෂ්පාදනය කරන ලද නාට්‍යයක් වනුයේ,

(1) කපුවා කපෝති (2) කඳා වළලු (3) වෙල්ල වැහුං (4) සක්කාය දිට්ඨි

35. නාඩගම් නාට්‍යයේ ආලෝකය සඳහා යොදා ගන්නා ලද ආලෝක පහන් විශේෂය වනුයේ,

(1) කිට්සන් පහන් (2) හැලජන් පහන් (3) විදුලි පන්දම් (4) ධාරාලෝක පහන්

36. සිරිසේන විමලවීරයන්ගේ ටීටර් නාට්‍යයක් වනුයේ,

(1) කුවේණි (2) මායා දේවි (3) අයිරාංගනී (4) සීදේවි

37. B. A. W. ජයමාන්නයන් විසින් නිර්මාණය කරන ලද ස්වතන්ත්‍ර නාට්‍යයක් වනුයේ,

(1) මධුර ජවනිකා (2) කපටි ආරක්ෂකයා (3) දෝන කතිරිනා (4) සිංහල වීරයා

38. දකුණු පස ඡායාරූපයෙන් දැක්වෙන වෙස් මුහුණ පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) A හා B දෙකම සන්නි යකුමට අයත් වේ.
(2) A හා B දෙකම කෝලම් නාටකයට අයත් වේ.
(3) A සන්නි යකුමට ද B කෝලම් නාටකයට ද අයත් වේ.
(4) B කෝලම් නාටකයට ද B සන්නි යකුමටද අයත් වේ.



A



B

39. කෙටි නාට්‍ය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) අංක කිහිපයක් කෙටිකර හැකිතාක් චරිත යොදා ගනිමින් නිර්මාණය කරයි.
(2) දිගු නාට්‍යයක කතා පුවතක් කෙටි කාලයක් තුළ රඟ දක්වයි.
(3) සීමිත චරිත යොදාගෙන නිර්මාණය වන්නා වූ ඒකාංගික නාට්‍යකි.
(4) කෙටි කාලයක් තුළ ජනප්‍රිය කෙටිකතාවක් ඇසුරු කර නිර්මාණය වූවකි.

PAST PAPERS WIKI

40. නාට්‍ය අධ්‍යක්ෂවරයා හෙවත් සොඳුරු ආඥාදායකයා නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර (2) සුගතපාල ද සිල්වා
(3) සයිමන් නවගත්තේගම (4) මාටින් වික්‍රමසිංහ

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	නාට්‍ය හා රංග කලාව II	කාලය / நேரம் / Time	පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- ❖ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

---

1) විකෘති නාටකය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. විකෘති නාටකයේ ඇතුළත් දර්ශන සංඛ්‍යාව කීයද? (ල. 02)

ii. නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

iii. විශ්ව විද්‍යාල ප්‍රතිඵල පැමිණෙන තුරු හිල්ඩා විසින් ප්‍රියංගනී හැදෑරීමට යොමු කරන පාඨමාලා දෙකක් සඳහන් කරන්න. (ල. 02)

iv. පළමුවර විභාග ප්‍රතිඵල මත ප්‍රියංගනීට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට හැදෑරීමට සුදුසුකම් ඇතැයි හිතන පාඨමාලාව කුමක්ද? (ල. 02)

v. නාට්‍යයේ බෙදනීය ඉරණමට මුහුණ දෙන පිරිමි චරිත දෙක කුමක්ද? (ල. 02)

vi. නාට්‍ය පෙළ රචනය තුළ දක්නට ලැබෙන දුර්වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

2) i. නූර්ති නාට්‍ය කලාව තුළ ජනප්‍රිය නිර්මාණකරුවන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

ii. නූර්ති නාට්‍ය කලාව මෙරට ප්‍රේක්ෂකයා අතර ඉක්මනින්ම ජනප්‍රිය වීමට බලපාන ලද හේතු හතරක් සඳහන් කරන්න. (ල. 04)

iii. නූර්ති නාට්‍ය නිසා පසුකාලීනව දේශීය නාට්‍ය කලාවේ සිදුවූ වෙනස්කම් විස්තර කරන්න. (ල. 06)

3) i. නාට්‍යමය ලක්ෂණ සහිත වූ බෞද්ධාගමික වත්පිළිවෙත් හතරක් නම් කරන්න. (ල. 02)

ii. බෞද්ධ පූජාකර්ම තුළට නාට්‍යමය ලක්ෂණ ඇතුළත් කිරීමෙන් බලාපොරොත්තු වූයේ කුමක් ද? (ල. 04)

iii. බෞද්ධාගමික වත්පිළිවෙතක දක්නට ලැබෙන නාට්‍ය ලක්ෂණ විස්තර කරන්න. (ල. 06)

4) i. ආර්. ආර්. සමරකෝන් විසින් අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. ඔහුගේ නාට්‍යවල පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 04)

iii. ආර්. ආර්. සමරකෝන්ගෙන් සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට සිදුවූ සේවය විස්තර කරන්න. (ල. 06)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

5) i. අභිරූපණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද? (ල. 02)

ii. අභිරූපණ රංගනයක දී භාවිත කරන ශිල්පීය ගමන් ක්‍රම හතරක් නම් කරන්න. (ල. 04)

iii. අභිරූපණ රංගනයන් නිර්මාණය කිරීමේදී ශිල්පියා අවධානයට ගත යුතු කරුණු මොනවාදැයි පෙන්වා දෙන්න. (ල. 06)

6) i. අංග රචනයට පිවිසීමේ දී ශිල්පියා විසින් සැලකිලිමත් විය යුතු මූලික කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. අංග රචනයේ දී යොදාගන්නා ද්‍රව්‍ය හා උපකරණ හතරක් බැගින් සඳහන් කරන්න. (ල. 04)

iii. අංග රචනය තුළින් නාට්‍යයට සපුරා ගන්නා අවශ්‍යතා මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 06)

7) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගනිමින් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න.

"මලිත් යනු වීරසිරි පවුලේ සිටින එකම දරුවා ය. ඉතා අහංකාර ගති ඇති දක්ෂයෙකි. අල්ලපු ගෙදර සිටින නෙසදි හා මිහින්ස සමඟ ඔහු නිතර සෙල්ලමට යයි. දිනත් තිදෙනා මිදුලේ ඇති අඹ ගසකින් ගෙඩියක් කැඩීමට තීරණය කරයි. මලිත් ගලක් රැගෙන අඹයට ගැසුව ද එම ගල පෙරළා පැමිණි වෙසදිගේ හිසට වදී. ඇය අඬමින් නිවසට දිව යයි....."

i. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ල. 04)

ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ල. 04)

iii. දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිතව නාට්‍යෝචිත අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා (ල. 04)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank